#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2412/36 - 2024 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2024.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන සහ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය, හරිනි අමරසූරිය වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වන ලද 2006 නොවැම්බර් මස 03 වැනි දින අංක 1469/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (කලින් කලට සංශෝධිත පරිදි වූ) පළකරන ලද නියමයේ උපලේඛනය, එහි I වන තීරයේ දැක්වෙන "වෛද්‍ය පීඨය" (2020 පෙබරවාරි මස 19 වැනි දින අංක 2163/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන "6. ප්‍රජා වෛද්‍ය විද්‍යා සහ පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය" යන අයිතමය වෙනුවට පහත දැක්වෙන සටහන ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ :-

"6. මහජන සෞඛ්‍ය හා පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය"

**හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය.

2024 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

EOG 11-0188